# තිරප්පනේ ප්‍රාදේශීය සභාව

## 2022.03.15 වන දින පෙ.ව.10.00 ට පැවති මහ සභා රැස්වීම් වාර්තාව

***පැමිණි සිටි ගරු මන්ත්‍රීවරුන්:***

| | | |
|---|---|---|
| 1. | ඩබ්.රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා | - ගරු සභාපති තුමා |
| 2. | ඒ.අන්වර් සදාක් මැතිතුමා | - ගරු සභික තුමා |
| 3. | එස්.තිස්ස විජේසිංහ මැතිතුමා | - ගරු සභික තුමා |
| 4. | එච්.එම්.නාසිම් මැතිතුමා | - ගරු සභික තුමා |
| 5. | පී.නිමල් රාජපක්ෂ මැතිතුමා | - ගරු සභික තුමා |
| 6. | ආර්.ප්‍රියංගන ප්‍රසාද් කුමාර රත්නායක මැතිතුමා | - ගරු සභික තුමා |
| 7. | ඒ.පී.මරියාහාමි මැතිණිය | - ගරු සභික තුමිය |
| 8. | කේ.නදිකා සෙව්වන්දි කරුණාරත්න මැතිණිය | - ගරු සභික තුමිය |
| 9. | ජේ.රෝහණ විජයතිලක මැතිතුමා | - ගරු සභික තුමා |
| 10. | ටී.එම්.තිළිණ රසාංග තිලකරත්න | - ගරු සභික තුමා |

***දන්වා නොපැමිණි ගරු මන්ත්‍රීවරුන්:***

| | | |
|---|---|---|
| 1. | පී.මධුර කුමාර පියරත්න මැතිතුමා | - ගරු සභික තුමා |
| 2. | බී.ආර්.තිලක් සුසන්ත රාජකරුණා මැතිතුමා | - ගරු සභික තුමා |
| 3. | එච්.බී.නලින් හේරත් මැතිතුමා | - ගරු සභික තුමා |

***නොදන්වා නොපැමිණි ගරු මන්ත්‍රීවරුන්:***

| | | |
|---|---|---|
| 1. | ආර්.පී.නිසංසලා ලක්මාලි අබේරත්න මැතිණිය | - ගරු සභික තුමිය |
| 2. | එන්.රශ්මි සංකල්පනා මැතිණිය | - ගරු සභික තුමිය |

***සහභාගි වූ නිලධාරීන්:***

| | | |
|---|---|---|
| 1. | ආර්.පී.පී.රේණුකා ලියනගේ මිය | - ලේකම් |
| 2. | කේ.බී.අක්ෂිලා සුජීවනී බණ්ඩාර මිය | - විෂය ලිපිකරු |

**(අ) පසුගිය රැස්වීම් වාර්තා සම්මත කිරීම.**

- **2022.02.15 වන දින පැවති ගරු මහ සභා වාරයේ වාර්තාව සභා සම්මත කිරීම.**

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

අද දිනට නියමිත ගරු මහ සභාවේ න්‍යාය පත්‍රයේ මුලින්ම තිබෙන්නේ 2022.02.15 වන දින පැවති ගරු මහ සභාවේ සභා වාර්තාව සභා සම්මත කරගැනීමයි. ඒ අනුව පසුගිය සභා වාර්තාවට සංශෝධන තිබේනම් ඒවා ඉදිරිපත් කරන ලෙසත්, පසුගිය සභා වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසත් මම ගරු මහ සභාවට ඉදිරිපත් කරනවා.

**<u>යෝජනා අංක 48-03-2022.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, 2022.02.15 වන දින පැවති ගරු මහ සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහ සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන්පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් 2022 පෙබරවාරි මස 15 වන දින පැවති ගරු මහ සභාවේ වාර්තාව පැමිණි සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.*

**<u>(ආ) ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන.</u>**

අද දින විශේෂ නිවේදන අවස්ථාව යටතේ මට කියන්න තියෙන්නේ රටේ උද්ගත වෙලා තියෙන තත්ත්වය අපිටත් අසීරුයි. ඉදිරියේදී මෙම තත්ත්වය තවත් උග්‍ර වුනොත් අපිත් අපහසුතාවයට පත් වෙනවා. මෙම වර්ෂයේ සංවර්ධන ව්‍යාපෘති විශාල ප්‍රමාණයක් ක්‍රියාත්මක වෙයි කියලා අපි හිතුවා. නමුත් රජය මගින් ඒවා කල් දාලා තියෙනවා. ඉදිරියේදී කුමන තත්ත්වයක් ආවත් අපි සාර්ථකව ඒවාට මුහුණ දෙමුයි කියා ඉල්ලා සිටිමින් අද දින විශේෂ නිවේදන අවස්ථාව මම මෙයින් හමාර කරනවා.

**<u>(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන මහ සභාවට ඉදිරිපත් කිරීම.</u>**

- ආදායම් පරීක්ෂක මහතාගේ 2022 පෙබරවාරි මස ආදායම් වාර්තාව ගරු මහ සභාවේ දැනගැනීම සඳහා මම ඉදිරිපත් කරනවා.

**<u>(ඈ) යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න.</u>**

කිසිවක් නොමැත.

**<u>(ඉ) යථා පරිදි කල්දී ඇති යෝජනා.</u>**

**<u>ලිපි අංක - I.</u>**

**<u>ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

අංක 544 මුරියාකඩවල තුලානේ ජේ.ඒ.වසන්ත නිහාල් ජයකොඩි යන අය අබලන් තත්ත්වයේ පවතින නළ ළිඳට විදුලි මෝටරයක් සවිකරගැනීමට ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තීරණයක් ගැනීමට ඉදිරිපත් කර සිටිනවා.

**යෝජනා අංක 49-03-2022.**

**ගරු ප්‍රාදේශිය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, මෙම නළ ළිඳ සඳහා විදුලි මෝටරයක් සවිකිරීම සුදුසු බවත්, එයින් අවට මහජනතාවගේ අවශ්‍යතාවයන් සඳහා ජලය ලබාදීම සුදුසු බවටත් මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශිය සභා සභික - ආර්.ප්‍රියංගන ප්‍රසාද් කුමාර රත්නායක මැතිතුමා .**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහ සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන්පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුයෙන් පැමිණි සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**ලිපි අංක - II.**

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

දෙමටෑගම ගවමස් වෙළඳසැල හා ඝෝගාතකාගාරය සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති ලිපි ගරු මහ සභාවේ සුදුසු තිරණයක් ගැනිමට ඉදිරිපත් කර සිටිනවා.

**යෝජනා අංක 50-03-2022.**

**ගරු ප්‍රාදේශිය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, දිස්ත්‍රික්කය පුරා ගවයන් හට කුර රෝගය පැතිරීම හේතුවෙන් ව්‍යාපාර කටයුතු කරගෙන යාමට නොහැකි වූ නිසාත් රටේ පවතින තත්ත්වයත් හේතුකොට ගෙන ජනවාරි සහ පෙබරවාරි මාස සඳහා සියළුම මස් කඩ වලින් මෙම බදුමුදල් අයනොකිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශිය සභා සභික - එච්.එම්.නාසිම් මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහ සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන්පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුයෙන් පැමිණි සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**ලිපි අංක - III.**

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

ලබුනෝරුව මහජන පුස්තකාලය සඳහා අළුතින් පොත් මිලදීගැනීමට ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තිරණයක් ගැනිමට ඉදිරිපත් කර සිටිනවා.

**යෝජනා අංක 51-03-2022.**

**ගරු ප්‍රාදේශිය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, අපි පුස්තකාල සඳහා අයවැයෙන් මුදල් වෙන් කරලා තියෙන්නේ. එම නිසා ඒ ප්‍රතිපාදන වලට අනුව ලබුනෝරුව සහ තිරප්පනේ යන පුස්තකාල දෙක සඳහා අළුතින් පොත් මිලදීගැනීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශිය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහ සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන්පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණි සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**ලිපි අංක - IV.**

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

ලබුනෝරුව මහජන පුස්තකාලය සඳහා පුවත්පත් මිලදීගැනීමට ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තිරණයක් ගැනීමට ඉදිරිපත් කර සිටිනවා.

**යෝජනා අංක 52-03-2022.**

**ගරු ප්‍රාදේශිය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, පුවත්පත් කියවා තොරතුරු දැනගැනීම මහජනතාවගේ අවශ්‍යතාවයක්. එම නිසා ලබුනෝරුව පුස්තකාලය සඳහා එක් ජාතික පුවත්පතක් හා ළමා පුවත්පතක් මිලදීගැනීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශිය සභා සභික - ජේ.රෝහණ විජයතිලක මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා. මෙම පුස්තකාලය දෛනිකව සක්‍රියව ක්‍රියාත්මක වෙනවා නම් සියළුම පුවත්පත් ලබාදෙමු. සමහර දින වල මෙම පුස්තකාලය වහලා තියෙනවා කියලා දැනගන්න ලැබුනා. මේ පිළිබඳව නිරන්තරයෙන් අධ්‍යනයක් කළ යුතුයි. මේක හරි වුවමනාවෙන් කළයුතු දෙයක්.

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහ සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන්පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණි සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය*

**ලිපි අංක - V.**

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

අංක 534 අලුත්පුංචිකුලම ශ්‍රී දුටුගැමුණු රජමහා විහාරස්ථානයේ පැරණි ප්‍රජා ශාලා ගොඩනැගිල්ල ඉවත් කරගැනීමට සහ එහි වහලයේ යකඩ සහ සෙවිලි තහඩු නව ගොඩනැගිල්ල සඳහා භාවිතයට අවසර ලබාදෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තීරණයක් ගැනීමට ඉදිරිපත් කර සිටිනවා.

**යෝජනා අංක 53-03-2022.**

**ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජයතිලක මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, අංක 534 අලුත්පුංචිකුලම ශ්‍රී දුටුගැමුණු රජමහා විහාරස්ථානයේ පැරණි ප්‍රජා ශාලා ගොඩනැගිල්ල ඉවත් කර එහි වහලයේ යකඩ සහ සෙවිලි තහඩු නව ගොඩනැගිල්ල සඳහා භාවිතයට ගැනීමට අවසර ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහ සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන්පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණි සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**ලිපි අංක - VI.**

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

2022 වර්ෂයේ ළමා හා කාන්තා කමිටුව පවත්වනු ලබන දිනයන් සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු මහ සභාවේ සුදුසු තීරණයක් ගැනීමට ඉදිරිපත් කර සිටිනවා.

| අනු අංකය | මාසය | දිනය |
|---|---|---|
| 01 | ජනවාරි | - |
| 02 | පෙබරවාරි | 17 |
| 03 | මාර්තු | 16 |
| 04 | අප්‍රේල් | 20 |
| 05 | මැයි | 18 |
| 06 | ජූනි | 16 |
| 07 | ජූලි | 20 |
| 08 | අගෝස්තු | 10 |
| 09 | සැප්තැම්බර් | 14 |
| 10 | ඔක්තෝබර් | 12 |
| 11 | නොවැම්බර් | 16 |
| 12 | දෙසැම්බර් | 14 |

**යෝජනා අංක 54-03-2022.**

**ගරු ප්‍රාදේශීය සභා සභික - කේ.නදිකා සෙව්වන්දි කරුණාරත්න මැතිණිය.**

ගරු සභාපතිතුමනි, 2022 වර්ෂයේ ඉහත සඳහන් කළ දිනයන් වල ළමා හා කාන්තා කමිටුව පැවැත්වීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ.පී.මරියාහාමි මැතිණිය.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහ සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන්පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුයෙන් පැමිණි සිටි සභිකවරුන්ගේ ඒකඡන්දයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**ලිපි අංක - VII.**

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

2021 දෙසැම්බර්, 2022 ජනවාරි , පෙබරවාරි, මාර්තු හා අප්‍රේල් මාස සඳහා ඉදිරිපත් කර ඇති අතිකාල තක්සේරු වාර්තා ගරු මහ සභාවේ සුදුසු තීරණයක් ගැනීමට ඉදිරිපත් කර සිටිනවා.

| අනු අංකය | නම | තනතුර | 2021 දෙසැම්බර් මස සේවයේ යෙදි ඉල්ලුම් කරන අතිකාල පැය ගණන | 2022 ජනවාරි හා පෙබරවාරි මස සේවයේ යෙදි ඉල්ලුම් කරන අතිකාල පැය ගණන | 2022 මාර්තු මස ඉල්ලුම් කරන අතිකාල පැය ගණන | 2022 අප්‍රේල් මස ඉල්ලුම් කරන අතිකාල පැය ගණන |
|---|---|---|---|---|---|---|
| 01 | එස්.පී.පී.කාවින්දි මෙනවිය | කළමනාකරන සේවා නිලධාරි | - | Feb-30 | 30 | 30 |
| 02 | ආර්.එම්.කේ.චන්ද්‍රසිරි මෙනවිය | ගිණුම් සහකාර | - | - | - | 40 |
| 03 | අජිත් කුමාර වනසිංහ මයා | මුරකරු | - | - | - | 75 |
| 04 | සී.බී.දිසානායක මයා | මාර්ග කම්කරු | 10 | Jan-26 Feb-30 | 30 | 30 |
| 05 | දිනේෂ් සංජය රුද්දිගු මයා | මාර්ග කම්කරු | - | - | - | 75 |
| 06 | ජේ.කුමාරසිංහ මයා | මාර්ග කම්කරු | - | - | - | 75 |
| 07 | ජේ.එස්.ප්‍රියංකර මයා | සෞඛ්‍ය කම්කරු | - | - | - | 75 |
| 08 | එම්.බී.නිජාබිදීන් මයා | සෞඛ්‍ය කම්කරු | - | Jan-44 Feb-50 | 50 | 50 |

**යෝජනා අංක 55-03-2022.**

**ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, සේවයේ අවශ්‍යතාවය මත අධීක්ෂණය යටතේ අතිකාල දීමනා ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - කේ.නදිකා සෙව්වන්දි කරුණාරත්න මැතිනිය.</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහ සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන්පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණි සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>ලිපි අංක - VIII.</u>**

**<u>ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

තිරප්පනේ පාසල ඉදිරිපිට උද්‍යානය ජනතා අයිතියට පත් කිරීමේ උත්සවයේ සංග්‍රහ කටයුතු හා අනෙකුත් වියදම් සභා අරමුදලින් දැරීමට අවශ්‍ය අනුමැතිය ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තීරණයක් ගැනීමට ඉදිරිපත් කර සිටිනවා.

**<u>යෝජනා අංක 56-03-2022.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, මේක සභාවට සම්පතක් වගේම සභාවේ වත්කමක් වෙනවා. තිරප්පනේ පාසල ඉදිරිපිට උද්‍යානය ජනතා අයිතියට පත් කිරීමේ උත්සවයේ සංග්‍රහ කටයුතු හා අනෙකුත් වියදම් සභා අරමුදලින් දැරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - පී.නිමල් රාජපක්ෂ මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහ සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන්පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණි සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>ලිපි අංක - IX.</u>**

**<u>ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

"ගම සමඟ පිළිසඳර" - ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 2022 සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යන මැයෙන් පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සභා අනුමැතිය ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තීරණයක් ගැනීමට ඉදිරිපත් කර සිටිනවා.

| අනු අංකය | ග්‍රාම නිලධාරී වසම | ව්‍යාපෘතියේ නම | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ඇස්තමේන්තු මුදල රු. |
|---|---|---|---|---|
| 01 | 559 සඳපාගම | සුසාන භූමි මාර්ගය ඇතුළත බෝක්කුවක් දැමීම | 950 | 300,000.00 |
| 02 | 563 දයාගම | දයාගම ක්‍රීඩා පිටියේ ඉතිරි වැඩ කටයුතු සිදු කිරීම | 322 | 300,000.00 |

**<u>යෝජනා අංක 57-03-2022.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, "ගම සමඟ පිළිසඳර" - ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 2022 සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යටතේ ඉදිරිපත් කර ඇති යෝජනා ඉතා කඩිනමින් ක්‍රියාත්මක කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජයතිලක මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, "ගම සමඟ පිළිසඳර" - ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ ව්‍යාපෘති කිපයක්ම ක්‍රියාත්මක කළා. මීට පෙර පළතුරු කඩ බෙදුවා. එම කඩ මධුර මන්ත්‍රීතුමාගේ හා හිටපු උප සභාපති ධර්මප්‍රිය මහතාගේ නිවෙස් අසල තිබුනා. එයාලගේ දුප්පත්කම කොහොම මැන්නද දන්නේ නෑ. මෙහෙම බලද්දි එයාලවත් දුප්පත්ම අය යටතට තමයි මනින්න වෙන්නේ. මහජනතාව අපෙන් මේවට ප්‍රශ්න කරනවා. මම කිවුවා දුප්පත්කම මත මැනලා තමයි ඒවා දීලා තියෙන්නේ කියලා. අපිට එයාලවත් ඒගොඩට තමයි දාන්න වෙන්නේ කියලා. මේකේ ගැටළුව එන්නේ සභාවට. කඩ තියෙන අයටම තමයි මේ කඩ දීලා තියෙන්නේ. තියෙන අයට වඩා නැති කෙනෙකුට මේවා දුන්නනම් හොඳයි කියන එක තමයි මම කියන්නේ. මේවා විනිවිඳභාවයකින් බෙදලා නෑ. මෙහි නාම ලේඛනය ඉදිරිපත් කරනවා නම් හොඳයි.

**<u>ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

ගරු මන්ත්‍රීතුමා අපි ඉල්ලීම් වලට අනුව නාම ලේඛනයකට තමයි මේවා බෙදුවේ. මම ඒක කාර්යාලයට ගිහින් දෙන්නම් බලන්න. අපි කඩ 48 ක් යෝජනා කළාට කඩ 09 යි හදන්න පුළුවන් වුනේ. ගරු තිස්ස මන්ත්‍රීතුමා, ගරු මධුර මන්ත්‍රීතුමා හා හිටපු උප සභාපතිතුමා ඉල්ලීම් කරලා තිබුනා මේ අයට දෙන්න කියලා. ඒ නිසා ඉල්ලීම් වලට අනුව තමයි අපි වැඩ කළේ. අනෙක් එක තමා මන්ත්‍රීවරුන්ගේ නමකට අපි කඩ බෙදාදීලා නෑ.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, මම ඉල්ලීමක් කළේ පළතුරු වෙළඳාමේ නියුතු අය හටම මෙම වෙළඳ කුටි දෙන්න කියලා. මම ඉල්ලීම් කළේ එහෙම අයට පමණයි. ඕනනම් ඔබතුමා ගිහින් බලන්න. ගරු අන්වර් සදාක් මැතිතුමා ගෙනා යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහ සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන්පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුයෙන් පැමිණි සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>ලිපි අංක - X.</u>**

**<u>ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

තිරප්පනේ වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය සඳහා නල ජලය ලබාගැනීමට ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තීරණයක් ගැනීමට ඉදිරිපත් කර සිටිනවා.

**යෝජනා අංක 58-03-2022.**

**ගරු ප්‍රාදේශිය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය සභාවේ දේපලක්. මේක අපේ පැරණි සභා ගොඩනැගිල්ල. මේ ගොඩනැගිල්ල සභාවට අයිති ගොඩනැගිල්ලක් නිසා සභාවේ නමින් මේ සඳහා පානිය ජලය ලබාගැනීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශිය සභා සභික - ජේ.රෝහණ විජයතිලක මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහ සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන්පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණි සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**ලිපි අංක - XI.**

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

අයාලයේ යන සුනඛයින් වන්නත් කිරීමේ වැඩසටහන සඳහා ඉන්ධන හා අදාල ගෙවීම් කටයුතු සිදුකිරීමට අවශ්‍ය අනුමැතිය ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තිරණයක් ගැනීමට ඉදිරිපත් කර සිටිනවා.

**යෝජනා අංක 59-03-2022.**

**ගරු ප්‍රාදේශිය සභා සභික - ජේ.රෝහණ විජයතිලක මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, අයාලයේ යන සුනඛයින් වන්නත් කිරීමේ වැඩසටහන සඳහා ඉන්ධන හා අදාල ගෙවීම් කටයුතු සිදුකිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශිය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා. ගිය සැරේ වන්නත්කරන වැඩසටහන සමහර පැති වල වුනේ නෑ. එම නිසා සියළු පැති ආවරණය වන ලෙස වන්නත්කරණ වැඩසටහන ක්‍රියාත්මක කරන්න කියන්න. අධීක්ෂණය සඳහා සභාවෙන් අයෙකු යොදවන්න කියලත් මම ඉල්ලීමක් කරනවා.

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහ සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන්පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණි සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**ලිපි අංක - XII.**

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

අංක 539 වෙල්ලමුදාව තුලානේ වෙල්ලමුදාව, තිරප්පනේ යන ලිපිනයේ පදිංචි පී.ඒ.සුනිල් වික්‍රමසිංහ යන අයට රජයේ ඉඩම් කොටසකින් බොරළු කැණීම සඳහා හෙක්ටයාර් 1.1586 ක් සඳහා ඉ.කො.78 බලපත්‍ර ලබාදීමට අවශ්‍ය නිර්දේශය ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තීරණයක් ගැනීමට ඉදිරිපත් කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ටී.එම්.තිළිණ රසාංග තිලකරත්න මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, ගිය වර සභාවේදි මේ පිළිබඳ ලොකු කතිකාවක් ඇති වුනා. ඉන්පසු මමත් ගරු මධුර මන්ත්‍රීතුමත් මේ පිළිබඳ නිරීක්ෂණයක් කළා. ගරු මධුර මන්ත්‍රීතුමා කිවුවා පරිසර කමිටුවෙන් තීරණයක් ගමු කියලා. ගිය මාසේ පරිසර කමිටුව තිබුණෙත් නෑ. මම අද උදේ කථා කරනකොට කිවුවා ඕක අනුමත කරලා දාන්න කියලා. නමුත් අපිට එහෙම කරන්න බෑ. අපි මහජන නියෝජිතයින්. අපි මේකට මීට වඩා හොඳ තීන්දුවක් ගමු.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ආර්.ප්‍රියංගන ප්‍රසාද් කුමාර රත්නායක මැතිතුමා .**

ගරු සභාපතිතුමනි, මමත් ගරු මධුර මන්ත්‍රීතුමත් ගියා බලන්න. එතනදි මධුර මන්ත්‍රීතුමා විරුද්ධ වෙලා තමයි හිටියේ. දෙන්න බැම කිවුවා. නමුත් හිතාගන්න බෑ දැන් මෙහෙම වුනේ ඇයි කියලා. මම ඉඳිගහවැව බොරළු වලට විරුද්ධ වෙනවා.

**යෝජනා අංක 60-03-2022.**

**ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජයතිලක මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, අපි ගියවර සභාවාරයේදි දැක්කා පරිසර කමිටුවේ සභාපතිවරයා විදියට මධුර මන්ත්‍රීතුමාගේ හැසිරීම. මේ බොරළු වලවල් 07 න් නතර වෙන්නේ නෑ. අයෙත් මේවට අවසර ඉල්ලනවා. පරිසර කමිටුවේ සභාපතිවරයා ගියසැරේ මේකට විරුද්ධ වෙලා. මේ සැරේ ඒක අනුමත කරනවා. එම නිසා පරිසර කමිටුවේ සභාපතිතුමා ගැන වෙනමම පරීක්ෂණයක් කරන්න ඕනේ. වැලි කැණීම් වලටත් අවසර දෙනවට මම කැමති නෑ. මේ සඳහා මම මගේ විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. ඒවගේම මම කියන්න කැමතියි අපි මහජන නියෝජිතයන් ලෙස මෙම පරිසර විනාශය නතර කිරීමට සහයෝගය ලබාදෙමු. එම නිසා මන්ත්‍රීවරුන්ගේ ස්ථාවරය ප්‍රාදේශීය ලේකම්තුමියට දැනුම්දීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ටී.එම්.තිළිණ රසාංග තිලකරත්න මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා. මොකද මෙම බොරළු වලවල් අඩි 04 ක් කිවුවොත් අඩි 08 ක් හාරනවා. අක්කර 01 ක් කිවුවොත් අක්කර 02 ක් වෙනවා. අපි අපේ පරිසරය රැකගන්න ඕනේ.

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේක මෙහෙ විතරක් වෙන දෙයක් නෙමෙයි. හැමතැනම මේක වෙනවා. මොකද රටේ සංවර්ධනයට මේ සම්පත් අවශ්‍යයි. අපි අපේ සීමාවන් තුළ ඉඳලා වැඩ කරමු.

**ගරු ප්‍රාදේශීය සභා සභික - පී.නිමල් රාජපක්ෂ මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, පරිසර කමිටුවේ සභාපතිවරයා අද මේක මඟහැරියා. මෙතුමාගේ මේ සභාපතිකමෙන් වැඩක් නෑ. කියනවා විතරයි වැඩ නෑ. පරිසර කමිටුවෙන් කියන දේ නෙමෙයි වෙන්නේ.

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

එතුමා අද උසාවි ගිහින් කියලා මට දැන්වුවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - කේ.නදිකා සෙව්වන්දි කරුණාරත්න මැතිණිය.**

ගරු සභාපතිතුමනි, මෙච්චර බොරළු වලවල් තියෙනවා නම් අපි සභාවට බොරළු වලක් ලබාගෙන අපි ඒකෙන් බොරළු ලබාදෙමු.

**ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, මම එදත් කිව්වේ මේ සඳහා අනුමැතිය දෙන්න කියලා. අදත් කියන්නේ ඒකයි. අපි ගිය සැරේ සභාවෙන් ඒක පසුවට කල් දැම්මේ මේවා පරීක්ෂා කරන්න. හැමෝම ගිහින් බලලා සභාවට නිර්දේශය දෙන්න ඕනේ. මධුර මන්ත්‍රීතුමා එතුමාගේ මතය සැරින් සැරේ වෙනස් කරන්න බෑ. එක මතයක ඉන්න ඕනේ. මොකද අපි දැක්කා ගිය සැරේ සභාවේ එතුමාගේ තීන්දු තීරණ. සභාවට බොරළු වලක් ගන්න බෑ. මේක යන්නේ වෙනම ක්‍රමයකට. මේකට අපි සුදුසු සාධාරණ දෙයක් හදලා දෙන්න ඕනේ. වැවේ ප්‍රශ්නය තියෙනවා. ඒක සාධාරණයි. නමුත් මේ සියල්ලටම විරුද්ධයි කියන මතයම දෙන්න එපා. මේකට හරි මතයක් ගේන්න. හැමෝම මේවා ගිහින් බලන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ටී.එම්.තිළිණ රසාංග තිලකරත්න මැතිතුමා.**

මධුර මන්ත්‍රීතුමත් එක්ක ගිහින් බැලුවා. එතුමා එහිදී කිව්වා සැහෙන වන විනාශයක් වෙලා තියෙනවා ඒනිසා මේකට විරුද්ධයි කියලා. නමුත් අද වෙනකොට එතුමාගේ තීරණය වෙනස් වෙලා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, අපි ගියවර සභාවේත් සැහෙන වෙලාවක් මේ පිළිබඳ කථා කළා. මෙවරත් එහෙමයි. තවත් දිගින් දිගට යන්නේ නැතුව ඔබතුමා ගරු මන්ත්‍රීතුමන්ලාගේ තීරණය ප්‍රාදේශීය ලේකම්තුමියට දන්වලා යවන්න.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ආර්.ප්‍රියංගන ප්‍රසාද් කුමාර රත්නායක මැතිතුමා.**

අපි ගිය සැරේ විරුද්ධ වුනේ අංක 547 ඉඳිගහවැව බොරළු වලවල් වලට විතරයි. මම ඉඳිගහවැව බොරළු වලවල් වලට විරුද්ධයි. අද ගිහින් බලන්න. බලලා ඔබතුමන්ලා කියන්න මම කියන දේ සාධාරණද නැද්ද කියලා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජයතිලක මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, මම කියන්නේ සමස්ථ බොරළු වලවල් පිළිබඳවයි. සියළු බොරළු වලවල් සඳහා අපි අනුමැතිය නොදී ඉමු.

**<u>යෝජනා අංක 61-03-2022.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ආර්.ප්‍රියංගන ප්‍රසාද් කුමාර රත්නායක මැතිතුමා.</u>**

අංක 539 වෙල්ලමුදාව තුලානේ සුනිල් වික්‍රමසිංහ යන අය බොරළු කපන්නේ තමන්ගේ ඉඩමකින්. එම නිසා ඒ සඳහා එකඟතාවය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - පී.තිමල් රාජපක්ෂ මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>යෝජනා අංක 62-03-2022.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, අපි තීන්දුවක් ගත්තොත් කොන්ද කෙලින් තියන් තීන්දු තීරණ ගන්න ඕනේ. මොකද එකකට අනුමැතිය දෙන්නත් තවත් එකකට නොදෙන්නත් සාධාරණ හේතු තියෙන්න ඕනේ. මේවට විරුද්ධ නම් ඉන් එකක්වත් දෙන්න බෑ. මම මේ තීන්දුව ගන්නේ අකමැත්තෙන්. මේකේ කෙලින් තීරණයක් තියෙන්න ඕනේ. ඒ නිසා මෙම බොරළු වලවල් එකකටවත් එකඟතාවය ලබාදීම නුසුදුසු බවට මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජයතිලක මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහ සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන්පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණි සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>ලිපි අංක - XIII.</u>**

**<u>ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

අංක 525 දෙමටවැව තුලානේ රජයේ ඉඩම් කොටසකින් බොරළු කැණීම සඳහා අංක 115/20, මානවිට, ජා-ඇල යන ලිපිනයේ පදිංචි එස්.එම්.එස්.කේ.සෙනවිරත්න යන අය හට හෙක්ටයාර් 1.1468 ක් සඳහා ඉ.කො.78 බලපත්‍ර ලබාදීමට අවශ්‍ය නිර්දේශය ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපියගරු මහ සභාවේ සුදුසු තීරණයක් ගැනීමට ඉදිරිපත් කර සිටිනවා.

- *යෝජනා අංක 62-03-2022 යටතේ සියළු බොරළු වලවල් සඳහා එකඟතාවය ලබානොදීමට තීරණය විය.*

**ලිපි අංක - XIV.**

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

අංක 541 මානක්කුලම තුලානේ රජයේ ඉඩම් කොටසකින් බොරළු කැණීම සඳහා පිත්තලකොණ්ඩැරුම, මරදන්කඩවල යන ලිපිනයේ පදිංචි එච්.පී.රංජිත් ජයතිස්ස යන අය හට හෙක්ටයාර් 0.1932 ක් සඳහා ඉ.කො.78 බලපත්‍ර ලබාදීමට අවශ්‍ය නිර්දේශය ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තිරණයක් ගැනිමට ඉදිරිපත් කර සිටිනවා.

- *යෝජනා අංක 62-03-2022 යටතේ සියළු බොරළු වලවල් සඳහා එකඟතාවය ලබානොදීමට තිරණය විය.*

**ලිපි අංක - XV.**

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

අංක 547 ඉඳිගහවැව තුලානේ ප්‍රාදේශිය ලේකම් සතු රජයේ ඉඩමෙන් බොරළු කැණීම සඳහා ඉඳිගහවැව, එප්පාවල යන ලිපිනයේ පදිංචි ඒ.එම්.ස්වර්ණා කුලතුංග යන අය හට අක්කර 01 යි පර්චස් 13.66 ක් වන ඉඩම සඳහා අවශ්‍ය නිර්දේශය ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තිරණයක් ගැනිමට ඉදිරිපත් කර සිටිනවා.

- *යෝජනා අංක 62-03-2022 යටතේ සියළු බොරළු වලවල් සඳහා එකඟතාවය ලබානොදීමට තිරණය විය.*

**ලිපි අංක - XVI.**

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

අංක 547 ඉඳිගහවැව තුලානේ ප්‍රාදේශිය ලේකම් සතු රජයේ ඉඩමෙන් බොරළු කැණීම සඳහා ඉඳිගහවැව, එප්පාවල යන ලිපිනයේ පදිංචි ඩබ්.දිපිකා විමලසේන යන අය හට අක්කර 01 යි රූඩ් 01 යි පර්චස් 10.16 ක් වන ඉඩම සඳහා අවශ්‍ය නිර්දේශය ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තිරණයක් ගැනිමට ඉදිරිපත් කර සිටිනවා.

- *යෝජනා අංක 62-03-2022 යටතේ සියළු බොරළු වලවල් සඳහා එකඟතාවය ලබානොදීමට තිරණය විය.*

**ලිපි අංක - XVII.**

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

අංක 547 ඉඳිගහවැව තුලානේ ප්‍රාදේශිය ලේකම් සතු රජයේ ඉඩමෙන් බොරළු කැණීම සඳහා ඉඳිගහවැව, එප්පාවල යන ලිපිනයේ පදිංචි පී.මහින්ද ගුණදාස යන අය හට අක්කර 01 යි රූඩ් 02 යි පර්චස් 12.15 ක් වන ඉඩම සඳහා අවශ්‍ය නිර්දේශය ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තිරණයක් ගැනිමට ඉදිරිපත් කර සිටිනවා.

- *යෝජනා අංක 62-03-2022 යටතේ සියළු බොරළු වලවල් සඳහා එකඟතාවය ලබානොදීමට තිරණය විය.*

**<u>ලිපි අංක - XVIII.</u>**

**<u>ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

අංක 537 සෙලෙස්තිමඩුව තුලානේ රජයේ ඉඩම් කොටසකින් බොරළු කැණීම සඳහා අංක 20, වෙට්ටංකුලම, හිදෝගම යන ලිපිනයේ පදිංචි සිසිල් කුමාර ජයසේන යන අය හට හෙක්ටයාර් 0.7134 ක් සඳහා ඉ.කො.78 බලපත්‍ර ලබාදීමට අවශ්‍ය නිර්දේශය ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තිරණයක් ගැනිමට ඉදිරිපත් කර සිටිනවා.

- *යෝජනා අංක 62-03-2022 යටතේ සියළු බොරළු වලවල් සඳහා එකඟතාවය ලබානොදීමට තිරණය විය.*

**<u>ලිපි අංක - XIX.</u>**

**<u>ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

අංක 524 පයිරිමඩුව තුලානේ රජයේ ඉඩම් කොටසකින් වැලි නිස්සාරණය සඳහා නො.387/E, ධර්මාරාම පාර, හුණුපිටිය, වත්තල යන ලිපිනයේ පදිංචි එම්.අකිල මේනක යන අය හට හෙක්ටයාර් 0.8512 ක් සඳහා ඉ.කො.75 බලපත්‍ර ලබාදීමට අවශ්‍ය නිර්දේශය ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තිරණයක් ගැනිමට ඉදිරිපත් කර සිටිනවා.

**<u>යෝජනා අංක 63-03-2022.</u>**

**<u>ගරු ප්‍රාදේශිය සභා සභික - පී.නිමල් රාජපක්ෂ මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, අංක 524 පයිරිමඩුව තුලානේ රජයේ ඉඩම් කොටසකින් වැලි නිස්සාරණය සඳහා නො.387/E, ධර්මාරාම පාර, හුණුපිටිය, වත්තල යන ලිපිනයේ පදිංචි එම්.අකිල මේනක යන අය හට හෙක්ටයාර් 0.8512 ක් සඳහා ඉ.කො.75 බලපත්‍ර ලබාදීමට අවශ්‍ය නිර්දේශය ලබාදිම සුදුසු බවට මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශිය සභා සභික - ආර්.ප්‍රියංගන ප්‍රසාද් කුමාර රත්නායක මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, මම එම යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහ සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන්පසු ගරු සභාපතිතුමා සභාව විමසිමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුයෙන් පැමිණි සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>ලිපි අංක - XX.</u>**

**<u>ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

ගල්කිරියාගම බෝසෙවන එකමුතු මරණාධාර සමිතිය මඟින් සංවිධානය කර ඇති ලේ දන්දිමේ වැඩසටහන සඳහා ආධාර උපකාරයක් ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තිරණයක් ගැනිමට ඉදිරිපත් කර සිටිනවා.

**<u>යෝජනා අංක 64-03-2022.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, මෙම ලේ දන්දීමේ වැඩසටහන සෑම වර්ෂයකම ක්‍රියාත්මක වෙනවා. මේක හොඳ වැඩක්. එම නිසා මෙම වැඩසටහන සඳහා සභා අරමුදලින් ආධාරයක් ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - පී.නිමල් රාජපක්ෂ මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහ සභාවෙන් ඉල්ලා සිටිනවා.

- ***ඉන්පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණි සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.***

**<u>ලිපි අංක - XXI.</u>**

**<u>ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

ප්‍රාදේශීය සභාව සතු වාහන හා යන්ත්‍ර සඳහා GPS Tracer උපකරණ සවිකිරීම සඳහා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තීරණයක් ගැනීමට ඉදිරිපත් කර සිටිනවා.

**<u>යෝජනා අංක 65-03-2022.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජයතිලක මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, ප්‍රාදේශීය සභාව සතු වාහන හා යන්ත්‍ර සඳහා GPS Tracer උපකරණ සවිකිරීම සුදුසු බවට මම යෝජනා කරනවා. ඒවගේම සේවකයන්ටත් හයි කරන්න වෙයි. වෙළඳ සංගමය හදන එක කොන්ත්‍රාත්කරුවෙකුට දීලා තියෙන්නේ. නමුත් එතන සභාවේ සේවකයෝ වැඩ.

**<u>ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

ගරු මන්ත්‍රීතුමා එතන තිබුන ගසක් ඉවත් කරන්න තමයි සභාවේ සේවයන් යෙදෙව්වේ. මොකද ඒක සභාවේ ඉඩමක්. ගස අයින් කරන එක ඇස්තමේන්තුවේ නෑ. ඒක අපි කරලා දෙන්න ඕනේ.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජයතිලක මැතිතුමා.</u>**

එහෙනම් ගැටළුවක් නෑ.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, ප්‍රාදේශීය සභාව සතු වාහන හා යන්ත්‍ර සඳහා GPS Tracer උපකරණ සවිකිරීම සුදුසු බවට ගරු රෝහණ මන්ත්‍රීතුමා ගෙනා යෝජනාව මම ස්ථිර කරනවා. මේවා සභාවේ වත්කම්. අපි මේවා ආරක්ෂා කරන්න ඕනේ. අපි මීට පෙර මෙම යෝජනාව ගෙනාවත් අපිට ඒක කරන්න බැරි වුනා. මේක ඉක්මනින්ම සවිකරන්න ඕනේ. එතකොට අපිට විනිවිද භාවයකින් මේක කරන්න පුළුවන්. සියළුම යන්ත්‍ර සඳහා මේක යොදා ගමු. තවම සභාවේ යන්ත්‍ර සූත්‍ර හා සේවකයන් පිළිබඳව අපිට සෑහීමකට පත් වෙන්න බෑ. මේකේ යම් යම් අකටයුතුකම් වෙනවා. ඉදිරියේදී හරි අධීක්ෂණයකින් මේක කරගෙන යමු.

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහ සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන්පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණි සිටි සභිකවරුන්ගේ ඒකඡන්දතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**ලිපි අංක - XXII.**

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

න්‍යාය පත්‍රය යැව්වට පසුව තවත් ලිපි කීපයක් ඉදිරිපත් කරලා තියෙනවා. තව මාසයක් ඉන්න ඕනේ නිසා අපි ඒ සඳහා තීන්දු තීරණ ගමු. මේවා අත්‍යාවශ්‍ය දේවල්.

ඒ අනුව අංක 252-6495 දරණ කැබ් රථයේ මේදින වල සිදු කරන අළුත්වැඩියාවන්ට අමතරව පහත සඳහන් අළුත්වැඩියාවන් සිදුකිරීමට අවශ්‍ය අනුමැතිය ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තීරණයක් ගැනීමට ඉදිරිපත් කර සිටිනවා.

- එන්ජින් ඔයිල් කාන්දුව සැකසීම.
- වයිපර් බ්ලේඩ් අළුතින් යෙදීම.
- බ්‍රේක් පද්ධතිය සැකසීම.
- කළු දුම් දැමීම පරීක්ෂා කර අවශ්‍ය කටයුතු සිදුකිරීම.
- ප්‍රධාන ස්විචය අළුතින් යෙදීම.

**යෝජනා අංක 66-03-2022.**

**ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, රියදුරු මහතා කිවුවා දැනට ඇස්තමේන්තුවේ මේ අඩුපාඩු නෑ කියලා. මීට පෙර අපි විශාල මුදලක් වියදම් කරලා මෙම වාහනය අළුත්වැඩියා කළා. නමුත් අපි සියළුදෙනාටම ඒකෙන් සෑහීමකට පත්වෙන්න බැරි වුනා. එතකොට රියදුරු මහතා කිවුවේ එතන ඉන්න දුන්නේ නෑ කියලා. දැන් එතුමාව පූර්ණකාලීනව එතනට යොදවලා තියෙනවා. රියදුරු මහතා කිවුවා මේක මෝටර් සයිකල් යතුරෙනුත් ක්‍රියාත්මක කරන්න පුළුවන් කියලා. එම නිසා යාන්ත්‍රික ඉංජිනේරු මහතා දැනුවත් කරලා ඇස්තමේන්තුවක් සකස් කරලා මෙම සියළු අඩුපාඩු සකස් කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - පී.නිමල් රාජපක්ෂ මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහ සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන්පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණි සිටි සභිකවරුන්ගේ ඒකඡන්දතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**ලිපි අංක - XXIII.**

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

උලගල්ල වලව්ව රිසෝට් ආයතනයෙන් අප වෙත ගෙවීමට ඇති බදු මුදල් වර්ෂයකට රුපියල් ලක්ෂ හය (රු.600000.00) බැගින් ගෙවීමටත් ගොනු කර ඇති නඩුවත් ඉවත් කිරීමටත් නතර කර ඇති වෙළඳ බලපත්‍රය ලබාදීමටත්, කසල බැහැරකිරීමේ කටයුතු සිදුකරදෙන ලෙසත් ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තීරණයක් ගැනීමට ඉදිරිපත් කර සිටිනවා.

**යෝජනා අංක 67-03-2022.**

**ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, අපි ගන්න තීන්දු තීරණ අනාගතයට බලපානවා. උලගල්ල හෝටලයේ වාර්ෂික ආදායමෙන් 1% කට බදු ගන්න පුළුවන්. අපි මේකට නඩු දාලා තියෙන්නේ. අපි මෙම නඩුවෙන් දිනන්නත් පුළුවන්, පරිදින්නත් පුළුවන්. මෙම හෝටලය කියන්නේ පසුගිය වර්ෂයක ලංකාවේ විශාලම ආදායම උපයපු සංචාරක හෝටලයක්. අද රටේ උද්ගත වෙලා තියෙන තත්ත්වයත් එක්ක බැලුවහම සංචාරක ව්‍යාපාරය හොඳටම කඩා වැටිලා තියෙන්නේ. අපි මේකට සාධාරණ තීන්දුවක් ගමු. එම නිසා 2018 වර්ෂයේ සිට රුපියල් ලක්ෂ හය (රු.600000.00) බැගින් ගෙවීමට ඇති සියළු මුදල් ගෙවා නිම කිරීමටත්, ඉන්පසු රට යහපත් තත්ත්වයකට පත්වන තෙක් 2023 වර්ෂයේ සිට වාර්ෂික ආදායමෙන් 0.5% ක මුදලක් අයකිරීමටත්, 2018 වර්ෂයේ සිට එකවර ලැබෙන මුදලින් ලක්ෂ පහක මුදලක් ස්ථිර තැන්පතු ලෙස තැන්පත් කිරීමටත් සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහ සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන්පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණි සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**ලිපි අංක - XXIV.**

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

කාර්යාලයේ සේවකයින් නොදන්වා රාජකාරි ආවරණය නොකර නිවාඩු ලබාගැනීම සිදුකරන බැවින් ඒ සඳහා සුදුසු තීරණයක් ලබාදෙන මෙන් ඉල්ලා වැඩ පරීක්ෂක මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තීරණයක් ගැනීමට ඉදිරිපත් කර සිටිනවා.

ඒවගේම මමත් මේක කියන්න ඕනේ. අද උදේ පිළිසරු එකේ මුරට කෙනෙක් නෑ. විදුලි වැට ක්‍රියා විරහිත කරලත් නෑ. මම උදේම ඒ දෙන්නට අවවාද කලා. දැන් තීරණයක් දුන්නා එහේ රාජකාරි වලට යනවානම් ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කරලා යන්න කියලා.

**<u>යෝජනා අංක 68-03-2022.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, වාහන වලට ලිඛිතව රාජකාරි ආවරණයත් සමඟ ලිපි ලබාදුන්නා. අද සේවකයෝ මොන තීන්දු තීරණ ගත්තත් ඒවා ක්‍රියාත්මක කරන්නේ නෑ. මේක විහිළුවකට සෙල්ලමකට අරගෙන රාජකාරි කරන ආයතනයක් බවට පත් වෙලා තියෙන්නේ. සේවකයෝ සභාව හැල්ලුවට ලක් කරනවා. අපේ වාහන පවා විනාශ කරලා තියෙන්නේ. අද පිළිසරු එකේ මුර නැත්නම්. එතන අය නැත්නම් ඒ සියළු දෙනාගෙන්ම නිදහසට කාරණා විමසලා ලිඛිතව යැවීම සුදුසු බවටත්, ඒ දෙන්නා අද නැත්නම් වෙන දෙන්නෙක් යොමු කරලා එයාලා මෙම කාර්යාලයේ සේවයේ යෙදවීම සුදුසු බවටත්, අද දවසට වැටුප් රහිත නිවාඩු දවසක් ලබාදීම සුදුසු බවටත් මම යෝජනා කරනවා. ඒවගේම ඊළඟ සභාවට මේකේ වාර්තාවක් ඉදිරිපත් කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජයතිලක මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා. මමත් දින දෙක තුනක් ගියා බලන්න. සමහර දින වල මුරකරු නෑ. අපි සේවකයෝ මෙතනට පත්වුනේ ඇයි කියලා හොයලා බලමු. එළියේ ඉන්න සේවකයෝ කිසිම දෙයකට බය නෑ. ඇතුළේ ඉන්න අය කිසිම දෙයක් ගණන් ගන්නේ නෑ. මිහින්තලේ, කැකිරාවේ සභා වල යම් ක්‍රමවේදයකට මේක යනවා. මේක නිවැරදි කරගන්න අපිට කොපමණ කාලයක් යයිද?.

**<u>ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහ සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන්පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුයෙන් පැමිණි සිටි සභිකවරුන්ගේ ඒකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>ලිපි අංක - XXV.</u>**

**<u>ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

දිවයිනේ සියළු පළාත් පාලන ආයතන වල දායකත්වයෙන් හඳුනාගත් ස්ථාන වල කොස් පැල 100000 ක් රෝපණය කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තීරණයක් ගැනීමට ඉදිරිපත් කර සිටිනවා.

**<u>යෝජනා අංක 69-03-2022.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, දිවයිනේ සියළු පළාත් පාලන ආයතන වල දායකත්වයෙන් හඳුනාගත් ස්ථාන වල කොස් පැල 100000 ක් රෝපණය කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා. අපි මෙම වැඩසටහන ස්ථාන කීපයක ක්‍රියාත්මක කරමු.

**<u>ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහ සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන්පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණි සිටි සභිකවරුන්ගේ ඒකඡන්දයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>ලිපි අංක - XXVI.</u>**

**<u>ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

“ගම සමඟ පිළිසඳර” - ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 2022 සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යන මැයෙන් පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සභා අනුමැතිය ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තීරණයක් ගැනීමට ඉදිරිපත් කර සිටිනවා.

**<u>පළාත් පාලන කොට්ඨාශ සංවර්ධනය (රු.මි.4).</u>**

| අනු අංකය | ග්‍රාම නිලධාරි වසම හා අංකය | ව්‍යාපෘති අංකය | ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තු මුදල රු. |
|---|---|---|---|---|
| 01 | 535-නාවිචාදුව | LGA/22/535/1/PID/2/1/926 | අල්ෆස් මහතාගේ නිවස අසල සිට හින් ඇළ දක්වා මාර්ගය කුට්ටිගල් අතුරා ප්‍රතිසංස්කරණය කිරීම. | 485,000.00 |
| 02 | 536-නාවිචාදුව | LGA/22/536/1/PID/2/1/927 | වාරි මාර්ග නිවස අසල සිට රුස්දි මහතාගේ නිවස ඉදිරිපිට දක්වා මාර්ගය කුට්ටිගල් අතුරා ප්‍රතිසංස්කරණය කිරීම. | 485,000.00 |
| 03 | 538-පලයාකුලම | LGA/22/538/1/PID/2/1/928 | පලයාකුලමේ වනසිංහ මහතාගේ නිවස අසල සිට ජයසිංහ මහතාගේ නිවස අසල දක්වා මාර්ගය කුට්ටිගල් අතුරා ප්‍රතිසංස්කරණය කිරීම. | 582,000.00 |
| | | එකතුව | | 1,552,000.00 |

**<u>ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති (රු.මි.3).</u>**

| අනු අංකය | ග්‍රාම නිලධාරි වසම හා අංකය | ව්‍යාපෘති අංකය | ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තු මුදල රු. |
|---|---|---|---|---|
| 01 | 535-නාවිචාදුව | GNA/154/535/1/PID/1/2719 | හුදා පල්ලිය අසල සිට හිං ඇල දක්වා කාණු පද්ධතිය සැකසීම | 582,000.00 |

**<u>යෝජනා අංක 70-03-2022.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, “ගම සමඟ පිළිසඳර” - ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 2022 සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යටතේ ඉදිරිපත් කර ඇති ව්‍යාපෘති ඉතා කඩිනමින් ක්‍රියාත්මක කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - එච්.එම්.නාසිම් මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහ සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන්පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණි සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**ලිපි අංක - XXVII.**

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියෙන් ලබාදෙන මූලික අරමුදල් BT-4 හා BT-5 (Basic Transfer) සඳහා නව ව්‍යාපෘති යෝජනා හඳුනාගැනීම ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියේ (LDSP) තුන්වන අදියර සඳහා වෙන් වන මුදලින් තිරප්පනේ වෙළඳ සංකීර්ණයේ දෙවන අදියර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අනුමැතිය ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තීරණයක් ගැනීමට ඉදිරිපත් කර සිටිනවා.

**යෝජනා අංක 71-03-2022.**

**ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියේ (LDSP) තුන්වන අදියර සඳහා වෙන් වන මුදලින් තිරප්පනේ වෙළඳ සංකීර්ණයේ දෙවන අදියර ක්‍රියාත්මක කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ආර්.ප්‍රියංගන ප්‍රසාද් කුමාර රත්නායක මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහ සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන්පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණි සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**(ජ) කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම.**

**2022.02.15 වන දින පැවති ළමා හා කාන්තා කමිටු වාර්තාව.**

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

2022.02.15 වන දින පැවති ළමා හා කාන්තා කමිටු වාර්තාව ගරු මහ සභාවේ දැනගැනීම සඳහා මම ඉදිරිපත් කර සිටිනවා.

**2022.03.02 වන දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව.**

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

2022.03.02 වන දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව ගරු මහ සභාවේ දැනගැනීම සඳහා මම ඉදිරිපත් කර සිටිනවා.

**(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ ඉදිරිපත් කිරීම.**

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

2022 පෙබරවාරි මස ආදායම් අය කර ගැනීම පිළිබඳ මාසික ප්‍රගති වාර්තාව (එල්.පී.06) හා මාසික වියදම් වාර්තාව (එල්.පී.13) ගරු මහ සභාවේ දැනගැනීම සඳහා මෙන්ම අනුමැතිය සඳහා ද ඉදිරිපත් කරනවා.

**යෝජනා අංක 72-03-2022.**

**ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.**

2022 පෙබරවාරි මස ආදායම් අය කර ගැනීම පිළිබඳ මාසික ප්‍රගති වාර්තාව (එල්.පී.06) හා මාසික වියදම් වාර්තාව (එල්.පී.13) සත්‍ය වාර්තා බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - එච්.එම්.නාසිම් මැතිතුමා.**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහ සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන්පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් 2022 පෙබරවාරි මස ආදායම් අය කර ගැනීම පිළිබඳ මාසික ප්‍රගති වාර්තාව (එල්.පී.06) හා මාසික වියදම් වාර්තාව (එල්.පී.13) පැමිණි සිටි සභිකවරුන්ගේ ඒකඡන්දතාවයෙන් සභා සම්මත විය.*

**(ඌ) නොපැමිණෙන මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අවසර ලිපි ඉදිරිපත් කිරීම.**

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

ගරු ප්‍රාදේශීය සභා සභික පී.මධුර කුමාර පියරත්න මැතිතුමා, ගරු නලින් හේරත් මැතිතුමා හා ගරු සුසන්ත රාජකරුණා මැතිතුමා අද දින ගරු මහ සභාවට පැමිණීමට නොහැකි බව දන්වලා තියෙනවා. එය ගරු මහ සභාවේ දැනගැනීම සඳහා මම ඉදිරිපත් කරනවා.

**(එ) ගරු සභිකවරුන්ගේ වෙනත් අදහස් ඉදිරිපත් කිරීම.**

**ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජයතිලක මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, කමිටු හතරෙන් මොන කමිටුවටද මම ඉන්නේ. ඒක දැනුම් දීලා නෑ.

ඒවගේම රටේ පවතින තත්ත්වය කථා කරන්න ඕනේ. සභාවක් විදියට අපි රජයට යෝජනාවක් ගේමු. මේ දුක්ගැනවිලි යොමු කරමු. අපිට ඉදිරියට මොන මොන විදියට මුණදෙන්න වෙයිද දන්නේ නෑ. අපි ජනතාව විඳින දුක ගැන කථා කරන්න ඕනේ.

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

ගරු මන්ත්‍රීතුමා කමිටු වල පත්කළ සාමාජිකයින් සභා වාර්තා වල සඳහන් වෙලා තියෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - එච්.එම්.නාසිම් මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, රාමසාන් උත්සවය තියෙනවා. නාච්චාදූවේ වීථි ලාම්පු බොහොමයක් අක්‍රිය වෙලා. ඒවා අළුත්වැඩියා කරලා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ආර්.ප්‍රියංගන ප්‍රසාද් කුමාර රත්නායක මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, 539 වෙල්ලමුදාව තුලානේ වෙල්ලමුදාව තම්මැන්නාගල මාර්ගය යන්න බැරි තත්ත්වයේ තියෙන්නේ. මෝටර් ග්‍රේඩර් කරලා දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා. ඒවගේම තමයි මධුර මන්ත්‍රීතුමයි මමයි ගිහින් බැලුවා බොරළු වලවල්. එතනදි අකමැති වෙලා පසුව කැමතියි කියලා ලියුමක් දීලා. මේක කොහොම වුනාද කියලා මට ප්‍රශ්නයක් තියෙනවා. මෙතුමා මොන පැත්තට බර වුනාද දන්නේ නෑ.

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

ඒ අනුව අද දින සභාවේ වැඩ කටයුතු වලට සහභාගීවී සහයෝගය ලබාදුන් සියළුම දෙනාට ස්තුතිවන්ත වන අතර, අද දිනට සභාවේ වැඩ කටයුතු හමාර කරනවා. ස්තුතියි.

2022.03.15 වන දින පැවති ගරු මහ සභාවේ වැඩ කටයුතු ප.ව.12.35 ට පමණ අවසන් විය.